# ගොවිජනපද ක්‍රියාවලිය, ශ්‍රී ලංකාවේ පැවති වාර්ගික බෙදුම්වාදයට හේතුපාදක වූයේද (සමාජ විද්‍යාත්මක කෙටි හැදින්වීමක්)

*ඊ. එම්. සමන්ත ඒකනායක*[1]

***ABSTRACT***

***Except few, all other countries in the world are considered as multi ethnic societies. When studying the international political process it is clear that various problems have occurred in these countries due to poor ethnic relations and inequality of resource distribution. When the major ethnic group becomes the ruling power of a country, most probably the needs of the minorities are neglected and the needs of majority are legally established (Ivan 1999). This condition provides the seed for an ethnic conflict. That is why the National Integration is important for the success of contemporary state concept in the world. It is revealed through a lot of examples that when the majority rules the country, the minority faces the exclusion in most of the countries in the world. Sri Lanka is also a fine example for it. The creation of National Integration was challenged in independent Sri Lanka. And according to the critics the civil war which prevailed in Sri Lanka was a direct result of this situation. The origin of prevailed conflict in Sri Lanka was rooted with different causes had been discussed by differed field of scholars. The process of colonization programme is considered as a major cause of it. This brief sociological analysis is to consider "Did the colonization program of Sri Lanka have an effect on the ethnic conflict in Sri Lanka?***

## හැඳින්වීම (Introduction)

පුරාණ ශ්‍රී ලංකාවේ රාජධානි විවිධ හේතු සාධක නිසා රජරට සිට නිරිතදිගට සංක්‍රමණය විය. ඒ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද්දේ ඉන්දීය ආක්‍රමණයන් බව ඓතිහාසික සාක්ෂි පෙන්නුම් කරයි. එබැවින් වියලි කලාපයේ වාරිපද්ධතිය බිඳ වැටීමත් සමග එහි ජනතාව විවිධ ප්‍රදේශයන්ට සංක්‍රමණය විය. වියළි කලාපයෙන් සංක්‍රමණය වූ ජනගහනය හේතුවෙන් තෙත් කලාපයේ විවිධ වූ අර්බුදයන් හටගත් අතර, එහිලා "භූමිය" ප්‍රධාන සාධකයක් වන්නට විය. (ලියනගමගේ සහ ගුණවර්ධන, 1961). විශේෂයෙන් ඉඩම් කොටස් වීම (Land fragmentation) භූමියෙහි ඵලදායීතාවය හීනවීම, නිෂ්පාදනය අඩු වීම, කැළෑ හෙළි වීම, ඒ අතර ප්‍රධාන ගැටළු බවට පත්විය. මෙයට පිළියමක් වශයෙන් ශ්‍රී ලංකාවේ "ගොවි ජනපදකරණය" (Colonization) ක්‍රියාවලිය ආරම්භ වූයේය.

ජනපදකරණය සම්බන්ධයෙන් දිගු ඉතිහාසයක් ඇති මුත් මෙහි දී අවධානයට ලක්කරනුයේ බ්‍රිතාන්‍ය යටත් විජිතකරණ අවසාන අවදියේ සිට රාජ්‍ය අනුග්‍රහය යටතේ සිදු කළ ජනාවාස ක්‍රියාවලිය කෙරෙහිය. ඒ අනුව බ්‍රිතාන්‍ය පරිපාලන ක්‍රියාවලිය යටතේ 1929 දී පත් කළ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමෙහි වාර්තාවට අනුව ඉඩම් ප්‍රතිපත්තියේ පරමාර්ථය වූයේ "ගොවි ජනපද" පිහිටුවා වී ගොවිතැන සඳහා වැඩි වැඩියෙන් ඉඩම් භාවිතයට ගැනීමය. එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කෘෂිකර්ම සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ඩී. එස්. සේනානායක මහතාගේ ප්‍රධානත්වයෙන් 1931 න් පසුව වාරිමාර්ග ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ සහ ගොවිජනපද ව්‍යාපාරය ද ආරම්භ කරන ලදී. (Farmer 1956). එතැන් පටන් ක්‍රියාත්මක වන ගොවිජනපද ක්‍රියාවලිය සම්බන්ධයෙන් විවිධ පර්යේෂණ සිදුව ඇත. වෙසසින් මෙය වාර්ගික සංහිඳියාව කෙරෙහි සෘණාත්මකව බලපෑවේය. යන්න දේශපාලනය තුළ මෙන්ම අධ්‍යයන ක්ෂේත්‍ර තුළත් සාකච්ඡාවට ලක්වූ සංසිද්ධියකි. එබැවින් ගොවිජනපද ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ පැවති වාර්ගික බෙදුම්වාදයට හේතුපාදක වූයේද? යන්න පිළිබඳ සමාජ විද්‍යාත්මක විමර්ශනය කිරීම මෙහි මූලික අරමුණයි.

## ක්‍රමවේදය (Methodology)

මෙම පර්යේෂණ ලිපිය සැකසීමේ දී ද්විතීයික දත්ත කෙරෙහි පමණක් පර්යේෂකයාගේ අවධානය යොමුකරන ලදී. ඒ අනුව සාහිත්‍යය විමර්ශනයේ දී පර්යේෂණ කෘති, සඟරා, පුවත්පත් සහ වෙනත් විවිධ මූලාශ්‍රයන් භාවිත කළ අතර, එමගින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සම්බන්ධතාවයට රාජ්‍ය විසින් ක්‍රියාත්මක කරන ලද ගොවිජනපද

ව්‍යාපාරය කවර ආකාරයෙන් බලපෑවේද යන්න පිළිබඳව සමාජ විද්‍යාත්මකව විමර්ශනය කරන ලදී.

### ශ්‍රී ලංකාවේ ගොවිජනපද ක්‍රියාවලියේ පෙළගැස්ම

1930 දශකයේ ක්‍රියාත්මක කළ ඉඩම් ප්‍රතිපත්තිය යටතේ ඉඩම් බෙදාදීම, යෝජනා ක්‍රම කිහිපයක් යටතේ කරනු ලැබීය. එනම්

1) ප්‍රධාන ගොවිජනපද ව්‍යාපාර
2) ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර
3) උස්බිම් ජනපද ව්‍යාපාර
4) මධ්‍යම පාන්තිකයන්ට ඉඩම් බෙදා දීම
5) තරුණ ගොවිජනපද ව්‍යාපාර
6) විශේෂ බදු ක්‍රම යටතේ ඉඩම් බෙදා දීම
7) සීමාසහිත ඉඩම් බෙදා දීම

නව ඉඩම් ප්‍රතිපත්තියෙන් පසු ශ්‍රීමත් ග්‍රෑම් තොම්සන්ගේ අනුග්‍රහය යටතේ 1933 දී මින්නේරිය ගොවිජනපදය පිහිටුවන ලදී. මින්නේරිය ප්‍රතිසංස්කරණය කොට ජන පදිකයන් 400 ක් එහි පදිංචි කළේය. 1935 ඉඩම් සංවර්ධන ආඥා පනතට අනුව රජයේ ඉඩම් බෙදාදීම වගා ව්‍යාප්ති, ග්‍රාමීය අවශ්‍යතා, ගොවිජනපද ව්‍යාපාර, මහජන අවශ්‍යතා, මධ්‍යම පාන්තිකයන්ට සහ වෙනත් අයට ඉඩම් ලබාදීම සඳහා බැව් තීරණය කරන ලදී.

1948 දී රජය ප්‍රකාශයට පත් කළ හය අවුරුදු සැලැස්ම තුළ වී වගාකරන භූමි ප්‍රමාණය අක්කර 131,000 කින් වැඩිකර ගැනීමට බලාපොරොත්තු වූ අතර, රජයේ ඉඩම් පවරා දීම හා ගොවිජනපද ව්‍යාපාර පිහිටුවීම වඩාත් ක්‍රමවත් වූයේ 1948 ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමඟය.

වර්ෂ 1935 දී සම්මත කරන ලද ඉඩම් අඥා පනත යටතේ ඉඩම් නොමැති පුද්ගලයන් සඳහා රජයේ ඉඩම් බද්දට රැගෙන වගාකර ගැනීමෙන් භුක්ති විඳීමට කටයුතු සලසන ලදී. මේ ඉඩම් ලැබීම සඳහා සුදුස්සන් ප්‍රාදේශීය ආදායම් නිළධාරී විසින් තෝරා ගන්නා ලද අතර, මෙම ඉඩම් අන් කිසිවෙකුටත් පැවරීමට ඉඩම් හිමියාට අවසර නොතිබුණි. කෙසේ වුව ද මේ ක්‍රමය යටතේ ඉඩම් පවරා දීම සීමාසහිත වූ බැවින් 1939 දී මෙම ප්‍රතිපත්තිය වෙනස් කරන ලදී. එහි දී අවධානය යොමු වූයේ තෙත් කලාපයේ විරැකියාව අඩු කිරීම, ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සහ සමෘද්ධිමත් භාවය ඇති කිරීම යන අරමුණු කෙරෙහිය. (Peebles1990). පසුව සෑම ජනපදිකයකුටම ආර්ථිකමය වශයෙන් ස්වාධීන වීම සඳහා ප්‍රමාණවත් ඉඩම් කොටසක් බෙදා දුනි. ඒ අනුව ගොඩ ඉඩම් අක්කර 3 ක් සහ මඩ ඉඩම් අක්කර 5 ක් වශයෙන් ඉඩම් අක්කර 8 ක් දෙන ලදී. මෙසේ

ලබා දුන් ඉඩම් රජයේ වියදමින් එළිපෙහෙළි කර දුන් අතර, ඔවුනට නිවසක් ද ලබාදෙන ලදී. ඊට අමතරව කෘෂි කටයුතු සඳහා ආධාර ද අස්වනු ලබන තෙක් ආහාර සහනාධාරයක් ද ලබා දී තිබේ. 1947 වර්ෂය වන විට මහා පරිමාණ වියලි කලාපීය ගොවිජනපද 12 ක් රුපියල් කෝටි 30 ට වැඩි වියදමක් දරා පිහිට වූ අතර, එහි ගොවි පවුල් 3,000 ක් පදිංචි කරවන ලදී. එනයින් 1953 වනවිට ගොවිජනපද ව්‍යාපාර 30 ක් ස්ථාපිත කරන ලදී. මෙම ජනපද යෝජනා ක්‍රමය යටතේ ගල්ඔය, ඇළහැර, මින්නේරිය, රිදී බැඳි ඇල්ල, රාජාංගනය, කිලිනොච්චිය, කාගම, ගිරිතලේ, නුවර වැව, දේවහුව හා බත්මැඩිල්ල වැනි ගොවිජනපද පිහිට වූ අතර 1953 වන විට මෙම ගොවිජනපද ව්‍යාපාර තුළ ඉඩම් අක්කර 114,838 ක ගොවි පවුල් 16,532 ක් පදිංචි කරවන ලදී.

1950 දශකයේ මැද භාගය වනවිට මෙම ගොවිජනපද සඳහා කඩිනමින් ප්‍රමාණවත් ලෙස ජල පහසුකම් හා අනෙකුත් පහසුකම් සපයාදීම පිළිබඳ ගැටළුවකට මුහුණ දීමට රජයට සිදුවිය. එබැවින් පැවති ප්‍රතිපත්තිය වෙනස් කිරීමට යෙදුණි. ඒ අනුව නව ප්‍රතිපත්තිය යටතේ ගොවීන් පදිංචි කරවීමට පළමුව එම ඉඩම් එළිපෙහෙළි කිරීමේ කටයුතු කරවන ලදී. කෙසේ වෙතත් මේ ක්‍රමය යටතේ ඉඩම් බෙදාදීම වේගවත් විය. 1956-1957 වසරේ බෙදා දෙනු ලැබූ ඉඩම් කට්ටි ප්‍රමාණය 3,500 ක් පමණ වුවත් ඉහත කරන ලද වෙනස්කම් යටතේ වසරකට ඉඩම් කට්ටි 7,500 ක් පමණ බෙදාදීමට හැකි වී තිබේ.

මෙම ක්‍රමය යටතේ ඉඩම් බෙදාදීම වේගවත් වුව ද ගොවීන් පදිංචි කරවීමේ කටයුතු ප්‍රමාද විය. එබැවින් පසුව මෙම ක්‍රමය ද වෙනස් කරන ලදී. මේ යටතේ ඉඩම් එළිපෙහෙළි කිරීම ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව පවරා ගන්නා ලදී. පසුව ගොවි පවුල් සඳහා තාවකාලික නිවාස ඉදිකර ගැනීමට ගොවි පවුලකට රුපියල් 80/= ක මුදලක් ලබා දුන් අතර, පසුව ඉඩමේ ස්ථිර නිවස තනා ගැනීමට රුපියල් 1,200/= ක ණය මුදලක් ලබා දෙන ලදී.

ගොවිජනපද ව්‍යාපාරය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ ගොවිජනපද සඳහා දරණ වියදම රජය අවම කිරීම කෙරෙහි අවධානය යොමු කොට තිබේ. පළමු අදියර යටතේ සියළුම වියදම් රජය දැරූ අතර, පසුව දෙන ලද ඉඩම් ප්‍රමාණය අඩු කිරීමට ද රජය කටයුතු කර තිබේ. 1948 ට පෙර මඩ ඉඩම් අක්කර 5 ක් හා ගොඩ ඉඩම් අක්කර 3 ක් වශයෙන් අක්කර 8 ක් ලබාදුන් ප්‍රමාණය පසුව මඩ අක්කර 3 ක් හා ගොඩ අක්කර 2 ක් වශයෙන් අක්කර 5 ක් විය. ඊටත් පසුව මඩ අක්කර 2 ක් සහ ගොඩ අක්කර 1 බැගින් අක්කර 3 ක් වශයෙන් ද ගොවි පවුලකට බෙදා දෙන ලදී.

මේ ආකාරයට අදියර කීපයකින් ක්‍රියාත්මක වූ ගොවිජනපද ව්‍යාපාර යටතේ 1969 අවසානය වන විට කුඹුරු ඉඩම් අක්කර 202,642 ද

ගොඩ ඉඩම් අක්කර 111,300 ක් ද බෙදා දී තිබූ අතර එම ගොවිජනපද තුළ ගොවි පවුල් 70,686 ක් පදිංචි කරවා තිබුණි. කෙසේ වෙතත් මේ ආකාරයට විශාල වශයෙන් වියදම් කර පිහිටුවන ලද ගොවිජනපදකරණය ලෝක බැංකුව විසින් විවේචනයට ලක්කරන ලදී ( Amarasinghe 1976).

***ගොවිජනපද අරමුණු සහ වාර්ගික බෙදුම්වාදය***

ගොවිජනපදකරණ ක්‍රියාවලිය දිගින් දිගටම ක්‍රියාත්මක කළ ද එහි සාර්ථකත්වය පිළිබඳව විමර්ශනය කිරීමේ දී පැහැදිලි වනුයේ එහි විවිධ ගැටලු උද්ගත වී ඇති බවය. එම ගැටළු අතර ගොවීන්ට ඉඩම් උපයෝජනයට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් අන්දමින් නොලැබීම විශේෂ වේ. එමෙන්ම ගොවිජනපද තුළ මූල්‍ය පහසුකම්, මිල දී ගැනීමේ පහසුකම්, අලෙවි කිරීමේ පහසුකම් ද නොමැති විය. තවද මහාමාර්ග, ජල සම්පාදන, විදුලිය, පණිවිඩ හුවමාරුව, නිවාස, වෙළඳපොළ, බැංකු, රක්ෂණ, අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් වැනි දෑ ගොවිජනපද තුළ නොමැති විය. එපමණක් නොව

1) සුළු ගොවීන්ගේ නිෂ්පාදන පිරිවැය වැඩිවීම.

2) ගොවිජනපදිකයන් තෝරා ගැනීමේ දී දේශපාලන බලපෑම්

3) ගොවිජනපද තුළ ආගමික කේන්ද්‍රස්ථානයක් මුල්කර සමාජ සංස්කෘතික සබඳතාවක් වර්ධනය නොවීම.

යථෝක්ත කාරණා හේතුවෙන් ගොවිජනපද ව්‍යාපාරයන් හි නිසි ඵල ලබා ගැනීමට නොහැකි වූ බව විවිධ අධ්‍යයනවේදීහු පෙන්වා දෙති.

1930 දශකයේ පටන් ශ්‍රී ලංකා ආණ්ඩුව ආරම්භ කරන ලද ගොවිජනපද ව්‍යාපාර සඳහා අරමුණු ගණනාවක් දැකිය හැකිය. ඒ අතර කෘෂි නිෂ්පාදන ඉහළ නැංවීම, තෙත් කලාපීය ජනගහන ගැටළුවට පිළියම් සැපයීම හා සමාජ ආර්ථික සාධාරණත්වයක් ඉටුවන ගැමි සමාජයක් ගොඩ නැංවීම ආදිය ජනාවාසකරණයේ මූලික අරමුණු විය. (නානායක්කාර 1987) මෙම අරමුණු මුදුන්පත් කරගැනීමේ සාර්ථක අසාර්ථකතාව විමර්ශනය කිරීමේදී ශ්‍රී ලංකාවේ ජනවාර්ගික සම්බන්ධතාවය කෙරෙහි මෙමගින් ඍණාත්මක බලපෑමක් සිදු වී ඇති බව තොරතුරු විමර්ශනයන් තුළින් පැහැදිලි වේ. යථෝක්ත අරමුණු පෙරටුකොට ජනපදකරණ ව්‍යාපාර (වියළි කලාපීය) ආරම්භ කළද එම තත්ත්වය ද්‍රවිඩ දේශපාලනඥයන් දුටුවේ කම සාම්ප්‍රදායික දෙමළ නිජභූමිය (Tamil Homeland) උදුරාගැනීමට ගත් ක්‍රියාමාර්ගයක් ලෙසිනි.

1949 ගල්ඔය ජනපද ව්‍යාපාරය තුළ මුළුමනින්ම පාහේ සිංහල ජනතාව පදිංචි කිරීම දේශපාලන උපක්‍රමයක් ලෙස ද්‍රවිඩ ජනයා හා මුස්ලිම් ජනයා කල්පනා කළහ. කෙසේ නමුත් ජනපදකරණ ව්‍යාපාරයට

දමිළ ජනතාව විරුද්ධවීමට හේතු කීහිපයක් විය. එනම් වැඩි ප්‍රතිශතයක් සිංහල පවුල් පදිංචිකිරීම පදනම් කොටගෙන ජනවාර්ගික සංයුතිය වෙනස්වීමෙන් දෙමළ ජනතාවට ඔවුන්ගේ නිජභූමිය අහිමිවේ යයි යන බිය එක් හේතුවකි. එම විරුද්ධත්වය ඔවුන් 1946 අගෝස්තු 19 ෆෙඩරල් පක්ෂ සමුළුවේ දී ප්‍රකාශ කළේය (Peebles 1990). 1949 දී ගොවිජනපද ව්‍යාපාරයේ ආරම්භක අවස්ථාවේ සිටම එයට ෆෙඩරල් පක්ෂය විරුද්ධ විය. (Wilson 1988).

1944 වර්ෂයේ දී දෙමළ කොන්ග්‍රස් පක්ෂය විසින් උතුරු නැගෙනහිර පළාත්හි පිහිටුවන ලද ගොවිජනපද ව්‍යාපාරවලට විරුද්ධව සොල්බරි කොමිසම හමුවේ පැමිණිලි කරන ලදී. සමස්තයක් ලෙස දෙමළ දේශපාලකයින් ජනපදකරණය සම්බන්ධයෙන් කිසිම සහයෝගයක් නොදක් වූ අතර, ඔවුන්ගේ අදහස වූයේ රජයේ විශාල මුදලක් වැයකරමින් ඔවුන්ගේ සාම්ප්‍රදායික නිජභූමිය අහිමි කිරීමට කටයුතු කරන බවයි. කෙසේ වෙතත් වියළි කලාපීය ගොවිජනපද ව්‍යාපාර හේතුවෙන් වාර්ගික සංයුතියෙහි පැහැදිලි වෙනසක් සිදු වී ඇති බැව් ජන සංගණන වාර්තා විමසුමට ලක්කිරීමේ දී තේරුම් ගතහැකිය. උදාහරණයක් ලෙසින් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ වාර්ගික සංයුතිය කෙරෙහි අවධානය යොමු කළහොත් මේ තත්වය තේරුම්ගත හැකි වේ. ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ ගොවිජනපද ව්‍යාපාර හේතුවෙන් වාර්ගික අනුපාතයෙහි සැලකිය යුතු වෙනසක් සිදුවිය. 1946 වර්ෂයේ සිංහල ජන ප්‍රතිශතය 20.7% ක් වන විට දෙමළ 40.1% ක් විය. එහෙත් 1981 ජන හා සංඛ්‍යාලේඛන වාර්තාවන්ට අනුව සිංහල 33.6% දක්වා වර්ධනය වන විට දෙමළ ජනගහනය 33.8% දක්වා පහළ වැටීමක් සිදුවිය. මේ සඳහා 1950 දශකයේ නැගෙනහිර පළාතෙහි ක්‍රියාත්මක කළ ජනාවාසකරණ ක්‍රියාවලිය හේතු වූයේය.

වගු අංකය : 1

ත්‍රිකුණාමලේ දිස්ත්‍රික්කයේ ජනවාර්ගික අනුපාතය, 2000

| ජනවර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය% |
|---|---:|---:|
| සිංහල | 103,853 | 29.29 |
| දෙමළ | 112,007 | 31.59 |
| මුස්ලිම් | 137,453 | 38.77 |
| වෙනත් | 1,240 | 0.35 |
| එකතුව | 354,553 | 100 |

මූලාශ්‍ර : Statistical Hand Book of Trincomalee District , 2000

ඉහත වගුවට අනුව ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ වර්ෂ 2000 වන විට බහුතර ජනවර්ගය මුස්ලිම් විය. එය 37.77% වූ අතර දෙමළ 31.59% සහ සිංහල 29.29% ක් ද විය.

මෙම සිංහල ගොවිජනපද ක්‍රියාවලිය සම්බන්ධව උතුරු නැගෙනහිර දමිළ ජනතාව රජයට තරයේ විරුද්ධත්වය ප්‍රකාශ කළහ. එබැවින් මේ සම්බන්ධව විවිධ පර්යේෂකයින්ගේ අවධානය යොමුව තිබුණි.

මෙයින් පැහැදිලිවන්නේ දෙමළ වාර්ගිකයින් දේශපාලනික වශයෙන් අයිතිවාසිකම් ප්‍රකාශ කිරීම මගින් ජන වර්ගයක් වශයෙන් ආරක්ෂිත ප්‍රදේශයක් වෙන්කර ගැනීමට උත්සහ ගත් බවයි. නමුත් සිංහල ජනපදකරණයෙන් ඔවුන් සුළුතරය බවට පත්වීම තුළ ජනවර්ගයක් වශයෙන් අනාරක්ෂිත වීමට ඔවුන් බිය වූ බවත් එබැවින් සිංහල දෙමළ ජනවාර්ගික සම්බන්ධතාවය පළුදුවීමටත් මේ තත්වය සෘජුව බලපා ඇති බව පැහැදිලි වේ.

ජනපද පිහිටුවීම සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශකරන අර්සරත්නම් (1986) දක්වනුයේ ,

''උතුරු මැද හා නැගෙනහිර පළාත්වල ජනපද පිහිටුවා සිංහල ජනයා වැඩි වශයෙන් පදිංචිකරවීම එම ප්‍රදේශවල දෙමළ ජාතීන් සුළු කොට්ඨාසයක් බවට පමුණුවාලීමට දරණ දේශපාලන උපක්‍රමයක් ලෙස ද්‍රවිඩයන් සලකන බවත් එම නිසා ඔවුන් තම නිජ භූමිය ලෙස සලකන උතුරු හා නැගෙනහිර පළාත් ආරක්ෂා කරගැනීමට නැගී සිටීම තුළින් ජාතිවාදී අරගලය උග්‍ර විය.''

රජයේ ගොවිජනපද ව්‍යාපාරය හරහා සිංහල ජනතාව දමිළ නිජ භූමිය ආක්‍රමණය කළ බව දමිළ ජනතාව සිතන බව රොබට් කර්නි ද (1985) දක්වයි. මේ අනුව ජනවාර්ගික අර්බුදය සඳහා වර්ගවාදී දේශපාලනයට දමිළ ජනතාව ඇද දැමීම සඳහා ගොවිජනපද ව්‍යාපාරය ද බල පෑ ප්‍රධාන කරුණක් වූයේය.

## ***නිගමනය (Conclusion)***

ගොවිජනපදකරණය ජනවාර්ගික ගැටුමක් බවට පරිවර්තනය වනුයේ එම ක්‍රියාවලිය සිංහල බෞද්ධ ජාතිකත්ව ක්‍රියාවලියකට පරිවර්තනය වීමත් සමඟය. නැතහොත් සිංහල බෞද්ධ ආධිපත්‍යයක් ජනපදකරණය තුළ ප්‍රචලිතවීමත් සමඟය. මෙය දිගු කාලීනව සමස්ථයක් ලෙස වාස්තවික ජාතියකගේ අවශ්‍යතාවයක් බව පීබල්ස් (1990) පෙන්වා දුණි.

''පළාත් සහා සංවර්ධන ව්‍යාපෘති මගින් සුළු වාර්ගිකයින්ට සිදු වූ අයුක්තිය

සඳහා සහන ලබාදීමට අවස්ථාව පැවතුණි. උදාහරණ ජාතික ඉඩම් කොමිසම විසින් පාලනය වූ උතුරු මැද පළාතෙහි යෝජිත ඇළ මඟින් උතුරු පළාතට වාරි ජලය ලබාදීමට එමඟින් යෝජිත විය.''

එහෙත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවුණි. එය ක්‍රියාත්මක වූයේ නම් උතුරු මැද පළාතේ බෞද්ධ කෘෂිකාර්මික ගොවිජනපද හා අසල්වැසි දෙමළ ජනතාව සමඟ ආර්ථික හා සමාජීය සම්බන්ධතාවය සමඟින් වාර්ගික ගැටුම වළක්වා ගැනීමට අවස්ථාව තිබුණි. එහෙත් රජය අර්ධ ශතවර්ෂයක් පමණ කාලයක් සිංහල බහුතරයකගේ යහපත උදෙසා ගොවිජනපද ව්‍යාපාර ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදැයි දෙමළ දේශපාලනික මතය විය. ජයවර්ධන රජය මෙම තත්වය තුළ සිංහල ජාතිකත්වය සහ දෙමළ බෙදුම්වාදය සැලකිල්ලට ගෙන ප්‍රතිපත්ති සකස් කළ ද එය අසාර්ථක විය. අවසාන ප්‍රතිඵලය වූයේ දෙමළ බෙදුම්වාදී ගරිල්ලා සංවිධානය විසින් (LTTE) සිංහල බෞද්ධ ජනපදවාසීන් ඝාතනය කිරීමය. (Peebles 1990). ගොවිජනපද ව්‍යාපෘතිය පදනම් කොටගෙන ඇතිවූ සිංහල දෙමළ ප්‍රතිවිරෝධතාවය ජනවාර්ගික අර්බුදය සඳහා ඍජුවම බලපා ඇති බැව් මින් පැහැදිලිය.

## *ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය (Reference)*


අමරදාස, ලියනගමගේ සහ ගුණවර්ධන, ලෙස්ලි. (1961). **අනුරාධපුර යුගය.** කැළණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය.

අයිවන්, වික්ටර්.(1999). **නිදහස, ජාතික ඒකාග්‍රතාවය හා දේශපාලන පවුල්පොරය.** කොළඹ: නන්දන මාරසිංහ අනුස්මරණ පදනම.

අයිවන්, වික්ටර්. (2006). **අර්බුදයේ අන්දරය.** මහරගම: රාවය පබ්ලිෂර්ස් ලිමිටඩ්.

ගුණවර්ධන, ලෙස්ලි. (1979). ***සිංහල ජනයා ඉතිහාසයෙහි සහ ඉතිහාසකරණයෙහි සිංහල හැඟීම.*** **ලංකාවේ ජාතිකත්ව ගැටලුව හා සමාජ විපර්යාශසය.** (සංස්) සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

ගුණවර්ධන, ආර්. (2005). **මහවැලි නිම්නය ආශ්‍රිත පුරාණ වාරි තාක්ෂණය.** කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නානායක්කාර, විජිත. (1987). ***මහවැලි ජනාවාසයන්හි පංති පෙළගැස්ම.*** **සමාජ විමසුම.** (සංස්) විජේසිංහ. එස්. එන්.

පුෂ්පකුමාර, ඩබ්.ඩී. එන්. ආර්. (1989). **ජනාවාසකරණය සහ සියදිවි නසාගැනීම, මහවැලි සී කලාපය ඇසුරින් කළ සමාජවිද්‍යාත්මක අධ්‍යයනයක්.** ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය. පේරාදෙණිය: පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

ප්‍රනාන්දු, පැට්‍රික්. (2000). ***ඇස්ගෙඩිවලට නෙත ගහල ද සිනහවන්නේ.*** **දියස.** වෙළුම 2, කලාපය 5.

ස්කොට්, ජෝර්ජ්. (1987). *ලංකාවේ වෙනස්වන ජනවාර්ගික සම්බන්ධතා: උඩරට ප්‍රදේශයක ජනවාර්ගික අර්බුදයක් සමථයට පත්වීම පිළිබඳ අධ්‍යයනයක්.* <u>සමාජ විමසුම.</u> (සංස්) විජේසිංහ. එස්. එන්.

සමරදිවාකර,වී.(2005). රජරට වාරිමාර්ග පද්ධතියේ විකාශනය. කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

සිරිවර්ධන, සුසිල්. (1979). ***ලංකාවේ එත්නික් විඥානය කෙරෙහි බ්‍රිතාන්‍ය ව්‍යවස්ථාදායක ප්‍රතිපත්තිය බලපෑ ආකාරය පිළිබඳව කෙටි සටහනක්.*** <u>ලංකාවේ ජාතිකත්ව ගැටලුව හා සමාජ විපර්යාශය.</u> (සංස්) සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

සිවතම්බි. (2008). ***වර්තමාන ශ්‍රී ලංකාවේ දෙමළ ජනතාව.*** **NIPU** පුවත් හසුන. පළමු කලාපය, කොළඹ: ජාතික ඒකාබද්ධතා වැඩසටහන් ඒකකය, පිටු 6-7.

Amarasinghe, Nihal. (1976). **An Overview of settlement schemes in Sri Lanka,** Asian Survey 16.

Arunathilaka N, Jayasooriya, Sisira & Kelegama, Saman. (2000). **The Economic cost of the War in Sri Lanka, Research Studies.** Colombo: Macro Economic policy and Planning Series- No 13.

Barth, F. (1969). **Ethnic groups and Boundaries the Social organization of culture difference**. London: Bergen University.

Farmer, B.H. (1957). **Pioneer peasant colonization in Ceylon.** Westport Connecticut: Oxford University press.

Kearney, Robert. (1978). **Language and the rise of Tamil separatism in Sri Lanka**. Syracuse University.

Kearney, R. N. (1973). ***The Politics of Ceylon (Sri Lanka).*** **Ithaca** ; London: Cornell University Press.

Liyanagamage, S. (1978). ***' A forgotten aspect of relations between the Sinhalese and the Tamils'.*** **<u>Ceylon Historical Review</u>**, vol. 25.

Samarasinghe, S. W. R. D. A. (1984). ***"Ethnic Representation in Central Government Employment and Sinhala-Tamil Relations in Sri Lanka: 1948-1981."*** **<u>From Independence to Statehood : Managing Ethnic Conflict in Five African and Asian States</u>**, (eds.) R. B. Goldmann, and A. J. Wilson. London:

Silva, K.T. (2003)***Armed conflict, displacement and poverty trends in Sri Lanka: evidence from selected displaced populations.*** **<u>Building Local Capacities for Pease: Rethinking Conflict and Development in Sri Lanka</u>**. (eds.) M. Mayer, D Rajasingham and Y. Thangarajah, New Delhi: Macmillan Press,

Silva, K.T.(1994). **Ethnicity, multiculturalism and violence among the urban poor in Sri Lanka. Sri Lanka Journal of Social Sciences 17 (1&2):**

Tambiah, S.J. (1955). ***Ethnic representation in Ceylon in higher administrative services 1870 – 1946.*** **University of Ceylon review XIII**.

Tambiah, S.J. (1992). **Buddhism Betrayed? : Religion, Politics, and Violence in Sri Lanka.** Chicago ; London: University of Chicago Press.

Wilson, A.J, (1972). **The Breakup of Sri Lanka The Sinhalese – Tamil Conflict**. London: C. Hurst and company.